


නිර්මාණ අඩවිය

ඉඳ හිට දවසක
www.ketapathpawra.com
අඩවියට ගොඩවන්න

# අවබෝධය

## රසිකා පෙරේරා

සිඩ්නි

**(සාහිත්‍ය චින්තා පද්‍ය රචනා තරගාවලියේ පළමු තැන දිනාගත් නිදහස් කවිය)**

දුක දනිමි
සීනුවට අවදි වී
සීතලේ ඇඳ පැළඳ
දුම්රියට දුව යාම දුකක් මැයි
කලු කෝපි උගුරකින්
ගිල දමා පාන් පෙති
පරිගණක තිරය මත ගල් ගැසී
සංසාර චක්කරේ පැදයාම දුකක් මැයි
දුකට කරුණද දනිමි
කොමසාරු මැදුර ලඟ පෝලිමේ
තෙරපිලා
වීසාව අයැදීම හේතුවය
ජනසවිය එපා වී දුර්මුඛව
පලා නොම ගිය කරුණ හේතුවය
දුක නැසුමද දනිමි
උපන් ගම රට වෙතට යලි ගොස්
ඉඳීන්නට හැකි වුනොත් දුක නැතිය
මේ මහා තරගයෙන් පලාගොස්
නිදන්නට හැකි වුනොත් දුක නැතිය
දුක නසන මග දනිමි
දරුවන්ගෙ ඉගනීම ඉවර වී...
ගේ උගස් ගිණුම අවසාන වී
පනස් පහ උදා වී...

පැහැදිලිය චතුර් සත්‍යය
අපැහැදිලිය අභිනිෂ්ක්‍රමණය

# මගේ තාත්තා

## සුජාතා අබේසිංහ

ඩැන්ඩිනොන්

නොරටක එන්න හිත හැ; හින්දාම දුකින්
ගම්බිම් දමා ආවෙමි සැප සතුට පතන්
නුඹගෙන් දුරස් වී ආ දා ගැන සිහියෙන්
මා ගැන තැවෙනවද තවමත් අඩ සිහියෙන්

නුඹගේ මුලු ලොවම දරුවන් බව දනිමී
මගේ සැප සතුට ලඟ නුඹ නිතරම රැඳුනී
එවන් පියෙකු තනිකර දා ආ පවෙනී
මා ලතවෙන තරම දන්නේ මා පමණී

සුර සැප නැතත් සැපසම්පත් අඩු නොමැතී
ගො දොර යාන වාහන සම්පත් ලැබුණී
අත ගැවසෙනා මිල මුදලුත් අඩු නොවිනී
නුඹගේ සෙනෙහෙ ළඟ පය දූවිලි පමණී

පියතුම ඔබේ දෙඇස් කඳුලින් පිරිලා ද
දරු සෙනෙහසේ ගඟ උතුරා ගැලුවා ද
ඒ පිය සෙනෙහසට කිසිවක් සමවේ ද
බුදු බව පතමි මට ලැබුනත් අපවාද

# අසූ විය පිරුණු අම්මාට

ඇසුනොත් කිසි තැනක හඬ දරුවකු හඬන
සසලව හදින් කරුණා ගුණ 'ඇද හැලෙන
යාචක දනන් දැක නෙත කඳුලෙන් පිරුණ
අම්මේ ඔබ හඳයි හැම දුක වෙත ඇරුණ

දුරු රට වුව ද අඹු දරුවන් සමග ගත
නිබඳව දුවයි ලක් මව වෙත සසල සිත
සැතපෙන රැයෙහි සුව යහනක වෙහස ගත
අම්මේ ඔබ ගැනම මතකෙන් පිරී ඇත

තෙරුවන් නමැඳ නිති සැම සත සුව පතන
බිළිඳකු ලෙසිනි සිනහව හැම හද බැඳුන
සපිරුණු අසූ විය වුව හදවත තරුණ
දිගුකල් දිනේ අම්මේ ලැබ බුදු සරණ

**පාලිත ගනේවත්ත**
සිඩ්නි

### *බිඳී ගිය පැතුම් රළ ..*



බෝම දුර ගෙවන් ආවේ සිදාදියේ
කෝම හරීම දැක ගන්නයි නුඹ පුතුනේ
කාට කියන්නද සොව මගේ ළය පතුලේ
පේන දුරක සිටියා නම් නුඹ මගෙනේ ..

නුහුරු සෙයිලමට ගියදා නුඹ තනියේ
සොඳුරු සිතුම් බිළි දුන්නේ කිම පුතුනේ
අඳුරු මාවතේ බාඳුරා පිපෙන පැයේ
වියරු වුණාදෝ කැළඹී සිතුවිලියේ ..

මතින් වියරු වී හඬමින් පොළොව බදා
තෙදින් වුන්නු නුඹ වියපත් මටත් වඩා
දුහුවිල්ලක් සුළඟක් ලෙස මාව දමා
කියන් කොතැන සැඟවුණිදැයි පුතුනි මෙදා

**ධම්මි විජේසිංහ** කැනඩාව.



### ආදරණීය වසන්තය

**බන්දුල විජේවර්ධන**
නවසීලන්තය

නුඹ ලස්සනයි
නුඹ ලස්සනයි
වසන්තය නුඹ මගේ

දෙපා මුල සිප ගන්න
මල් වැස්සක් වසින්න
වසන්තය නුඹ මගේ

එපා හිරු බැස යන්න
එපා තරු පායන්න
වසන්තය නුඹ මගේ

නුඹට හොරා
මගේ සිතේ ඇඳි
වසන්තය නුඹ මගේ

පිනි කැට විසිරුන
මල් මාවත අද්දර
සැමදා හමුවෙමු
වසන්තය නුඹ මගේ

# සැප විඳිමුද - දුක් විඳිමුද

## චන්ද්‍රානි රාජකරුණා

**තෝමස්ටවුන්**

තුරුලිය සිප එන
පවන වලක්වා
කෘතිම පවනින්
හිස දෙදරවා
සැපසේ දුක් විඳිමුද?
දුකසේ සැප විඳිමුද?
දුම්රියේ බස්රියේ කවට
සිනා කෙළි
මතකයෙන් පලවා
සුව පහසු රථයේ අසුනට බරවී
හුදෙකලාව
සුවසේ දුක් විඳිමුද?
දුකසේ සැප විඳිමුද?
කොස්, පොළොස්, අල, බතල
කරවල හොදි සහ මැල්ලුම්
සුවඳ මතකයේ රඳවා
හැම්, බේකන්, චීස්, බටර්
පෝක්, බීෆ්, ඩෙවල් චිකන්
තුන් වේලම බඩ පුරවා
ජීවක ඇසුරේ පිහිටෙන්
දුකසේ සැප විඳිමුද?
සැපසේ දුක් විඳිමුද?

# හෙල රිද්ම. . . . . . .

හෙල බිම වෙතට මේ තරමට ගරහන්නේ
මුල සිඳගෙන සිටින බවකිය පැවසෙන්නේ
පල වැල නෙලා ගත් ගස නොම වනසන්නේ
හළ මැන එදිරි ඉපදුන දේශෙට මෙදිනේ

බීලා දිය කඩිති වල පිරිසිදු වතුර
ආවඩනව නේද? කර දිය පිරි සයුර
ගස උස ගියත් පීරා මේ කුළු අතර
අතු කොළ වැටෙන්නේ ගහ මුලටයි මිතුර

ගම්බිර පෞඪ ඉතිහාසය දිනු එබිමේ
මෙතරම් කලින් ඇයි අමතක කර දැම්මේ
නැත ගල්අඟුරු තෙල්, දිය බැඳි වැව් බැම්මේ
ජනයා නොවෙද සම්පත අප රට උරුමේ

ගස් ගල් අතර දෙවටේ දිය කඩිති වල
මිරිවැඩි නැතිව පා නැගි ගුරු පාර වල
බස්රිය කෝච්චිය නුඹෙ ජීවිතය තුල
අමතක වෙතොත් ලද ශිල්පය කිමද පල

නිදහස් අද්දියාපනයක් ලැබුවාට
තවමත් නුඹ ණයයි මේ දූප්පත් රටට
එය නැති උනා නම් නුඹ එනවද? මෙරට
නමදිනු වටී සැමදින පැත්තට එරට

නොමිලේ ඉගෙන ගෙන මව් රට හැර යැවුනු
සොයනා විටදි නුඹ පින්කර ඇති ලකුණු
මාපිය මිතු සොයුරු කැළ එහි හැර දැමුණු
නැතිවම කතර වසනා පව මයි දරුණු

සමගුණ සිසිල නිල්පැහැයෙන් ඔප වැටුණු
සැරසුන කඳු පියස් දූල් සළුවෙන් එතුණු
පෙරපින විලස ඉපදෙන්නට වෙයි කරුණු
සිහිවන විට දැනේ සිහිනෙන් එහි සරණු

නැගි හිණි මගට කිස්දින පා පහර එපා
බත් දුන් අත සපා කන්නට සිතනු එපා
පරගැති වෙලා හෙල බිම ගරහන්න එපා
නුඹ රැක ගැණුනු මව්රට පිටුදකිනු එපා

**ප්‍රකාශ වැල්ලහේන,** කැන්බරා

# මිනිසත් කම වටී

## විජායි ලක්ෂ්මී දම්මුල්ල

පර්ත්

**(සාහිත්‍ය චින්තා පද්‍ය තරගාවලියේ පළමු තැන දිනා ගත් සඳැස් පද්‍යය)**

කොතරම් සිහින දුටුවද හද බැඳි මියුරු
එතරම් සැබෑවක් කෝ කොතැනද සොයුරු
ගනරන් පිඬක් සේ වට කළ නිල් සයුරු
මනරම් දිවයිනට යළි පැමිනුණු අයුරු

පැහැයට ආගමට කුල වත ගොතට තැන
නැහැ පිල් බෙදුම් දුටුවේ සිත සසල වන
වැහි දිය ලෙසින් මිහිතලයට සිසිල දෙන
විසි වසරක සිහින දුටුවෙමි යනෙන තැන

කවදා කෙසේ ආවාදැයි නැත දන්නේ
කොහොමද ඉතින් අප පිළිසරණක් දෙන්නේ
මිනිසුන් නොවූ මිනිසුන්ගේ සිත දන්නේ
අද අප අපේ කම කෙළසා ගෙන ඉන්නේ

මසකට වරක් වත් හොඳ සිංහල තාලේ
රස මසවුළු තනා රසවත් වුණු කාලේ
යට ගිය සිහිනයක් මෙනි එය අප බාලේ
අද කොතැනක ද මුතු පෙළ ගෙල බැඳි මාලේ

අත මිල මුදල් කිසිවක් නොමැතිව පැමැණී
හිත මිතුරනට සලකන පන වැනි දෙවැනී
හිත හොඳ විදෙස් මිතුරනි ඔබ අති රමණී
නැති තැන ඔබ මෙලොව හිස් බඳුනක් පමණී

කඳුලක් තරම් වූ රටකින් පැමැණී කුඩා
ආගන්තුක අපට ලෙන්ගතු කමට දොඩා
දහමක් කියූ මිනිසුන් වෙත කියමි හඬා
මිනිසත් කම වටී ලේ හුරු කමට වඩා




සමනල කුමරුවන් මල් ගොමු මත රඟදී
මල් කුමරියන් සිප සනසාලන විටදී
මුළු පරිසරය රසබර හැඟුමින් පිබිදී
හමුවෙයි වසන්තය දැන් මෙල්බන් පුරදී

වෙනසක් කියා නොමැතිව උදයයි සවස
කාළය සමග දිව යමි දවසින් දවස
ඉන්නට ඔබගෙ සෙනෙහස අබියස ගැවස
එතරම් ඈත නැහැ මව්බිම එන දවස

නෙත ඇඳි සොඳුරු සිතුවම් ගම වෙල් යායේ
හිත බැඳි මිහිරී නද කෙවිලියකගෙ ගීයේ
අබිමානවත් විසිතුරු රජමැති පායේ
අසිරීය විඳිමු නෑනන්ඩියෙ අපි ආයේ

අවුරුදු දෙසිය ගණනක් වන ළඟපාත
ඉතිහාසයකි උරුමය මේ බිම සීත
ලස්සන දියුණු යුගයක් නිම කළ මෑත
පාලකයිනට ඇත මෙහි සමගියෙ දෑත

කම්කරු රජය වෙත ලද පැරදුම අනුව
ලිබරල් රජය ආවත් ජන්දෙන් දිනුව
සංවර්දනය අරඹන ලද වැඩ ගොනුව
වෙනසක් නොමැත මෙහි ඇති පිළිවෙත අනුව

රට පාලනය කරවයි ජන සම්මතය
හැම මිනිසෙකුම මෙහි ඇති ලොකු සම්පතය
නිජබිම දේශ සීමාවන් නම් නැතය
බහුජන සමාජය මුළු ලොව රන්පිතය

මහ මැතිවරණයක් මෙහි පවතිනදාට
කිසිවෙකු ගැටෙනු නැත වෙනුවෙන් තම පාට
පාලන බලය ජය කිසිවකු ලැබුවාට
පැරදුනු කෙනකු නම් නැත ජය නැතුවාට

මව්බිම සොඳුරු යුගයක හිරු නැගීයන්
නීතිය දහම ගජ කුඹුතල රැ ළීයන්
කෙත්වතු හරිත පැහැයෙන් පල දැරීයන්
අපගේ පැතුම් මල් හෙටදින පිපීයන්




එපමණ කළෙක සිට අප ආ ගමන අද
මල්පල දරන විට ආසිරි සුවඳ මැද
දෙහදෙහි පැතුම් රැ ළි එකිනෙක තරඟ වැද
මෙතෙරට ඇදෙන හැටි ඔබටත් දැනෙනවද

නෑදෑ හිතවතුන් මව්පිය යන ආදී
සියලුම දෙනා සමගින් ගිය සතියේදී
සම්බුදුන් වැඳ පුදා ජයසිරි මහ බෝදී
සිත සැනසුනා රජරට ගිය ගමනේදී

කැන්ගරු බිමෙහි ඇති පිළිවෙත අනුව යමින්
පාලන රටා සංකල්පය රටට දෙමින්
රට ඉදිරියට ගෙන යන බව සුහද කමින්
රැ විදෙයි අලුත් මතයක් මැතිවරණ බිමින්

ජාතික ආපදාවක මව්බිම පත්වී
අවතැන් පිරිස ලතවෙන මහමග අත්වී
වසරක් පුරාවම නෙත කඳුලින් තෙත්වී
මහමැතිවරණයෙන් ඇත හොඳටම රත්වී

පාලන බලය පිළිබඳ තරඟයට යෙදී
වියදම කෝටි ගණනක් බව කියන ලදී
අසරණයනට අතු සෙවනක් පමණ නොදී
විසිතුරු තොරන් සැරසිලි මග දෙපස බඳී

ජනහමුවකට ගොස් ගෙදරට එන දාට
ලොකු අයියාට නැහැ කිසිවක් වැඩි ඊට
අප්පච්චිනම් පවසයි " ඔය කෙරුවාට
ලොකු වෙනසක්ලු මේ දාහත් වෙනිදාට්

සාමය සතුට හිත අසලම ගැවසෙන්නයි
දෙතොලග සිනා මල් මුවගැබ සරසන්නයි
සෙනෙහස් විමානයෙ අබිසෙස් ලැබ ගන්නයි
අයියන්ඩියගෙ රුව හැබැහින් දැක ගන්නයි

**ජගත් වෙත්තසිංහ**

Disney Maintenance
DM
INDUSTRIAL
COMMERCIAL
DOMESTIC
CARPET STEAM CLEANING - HARD FLOOR CLEANING & SEALING
Disney Maintenance
Rohan Tel: 03 9792 0656 Mob: 0408 106 022